# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2377/40 – 2024 මාර්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා – 2024.03.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 277/40 (iv)

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

18 වන වගන්තිය යටතේ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මම, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා "ආරක්ෂිත ස්මාරක" වශයෙන් සලකනු ලැබිය යුතු බව ප්‍රකාශයට පත් කරමි.

මේ නියමයේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්මාරක සම්බන්ධයෙන් වන දැන්වීම පුරාවස්තු ආඥාපනතේ 19 වන වගන්තිය ප්‍රකාරව 2023 සැප්තැම්බර් මස 16 වැනි දින අංක 2349/41 දරන *අතිවිශෙෂ* ගැසට් පත්‍රයේ පළකරන ලදී.

**විදුර වික්‍රමනායක,**
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය,

2024 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

### ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ස්මාරක

1. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වක්වැල්ල අංක 121 ග්‍රාම නිලධාරී වසමට අයත් බටුවන්තුඩාව ශ්‍රී සුගතාරාම විහාර භූමියේ පිහිටි මහනුවර යුගයේ සිතුවම් සහිත ප්‍රතිමාගෘහය.

2. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බතීගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමට අයත් බතීගම දිසවාළුකාරාම රජමහා විහාර භූමියේ ඇති පොහොය සීමාව සහ ධර්මශාලාව.

3. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 408 සී කඹුරුගමුව දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් ගොඩකන්ද ග්‍රාමයේ පිහිටි පුරාණ සමුද්‍රතීර මහ විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමාගෘහය, දාගැබ සහ ධර්මශාලාව. (උතුරු අක්ෂාංශ 5° 56 20.5" N හා නැගෙනහිර දේශාංශ 80° 30' 14.4" E)

4. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෝරඹ කනංකෙ උතුර, 372 ග්‍රාම නිලධාරී වසමට අයත් කනංකෙ රජමහා විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමාගෘහය (උතුරු අක්ෂාංශ 6°0242.4 N හා නැගෙනහිර දේශාංශ 80° 2451.4 E)

5. දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වගේගොඩ ග්‍රාම නිලධාරී වසමට අයත් වගේගොඩ රන්කොත්මළු විහාර භූමියේ ඇති,

   I. ටැම්පිට විහාර නටබුන් ගොඩැල්ල සහ එහි සිට උතුරු දිශාවට මීටර් 2 සෙ. මී. 50 ක් ද නැගෙනහිර, දකුණු හා බටහිර දිශාවලින් මීටර් 03 ක් ද වශයෙන් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6° 3'24.3" N හා නැගෙනහිර දේශාංශ 80° 40°57.6"E)

   II. පැරණි ස්තූපය සහ එහි ප්‍රාකාරයේ සිට උතුරු නැගෙනහිර හා දකුණු දිශාවන්ට මීටර් 05 ක් හා බටහිර දිශාවට ප්‍රාකාර බැම්ම ඇතුලත්වන භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ 6° 3'24" N හා නැගෙනහිර දේශාංශ 80° 40' 59" E)

6. සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දූනුගම - මාලියද්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාලියද්ද ශ්‍රී සුදර්ශනාරාම විහාරභූමියේ ඇති ටැම්පිට විහාරය (උතුරු අක්ෂාංශ 7° 16' 28" N හා නැගෙනහිර දේශාංශ 80° 27' 55" E)

7. සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 48A කෙහෙල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කෙහෙල්වත්ත ශ්‍රී ජයවර්ධන පිරිවෙන් විහාර භූමියේ ඇති ප්‍රතිමාගෘහය, ධර්මශාලාව, පොහොයගෙය ලෙස භාවිතා කරන දෙමහල් ගොඩනැගිල්ල සහ එම දෙමහල් ගොඩනැගිල්ලේ සිට සිව් දිශාවට මීටර් 02 බැගින් වූ භූමි පරිශය. (උතුරු අක්ෂාංශ 7° 10' 28" N හා නැගෙනහිර දේශාංශ 80° 22' 52" E)

8. සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වතුර අංක 54A ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වතුර රජමහා විහාර භූමියේ ඇති බෝධි ප්‍රාකාරය සහ එහි සිට සිව් දිශාවට මීටර් 02 බැගින් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 7 °11' 20" N හා නැගෙනහිර දේශාංශ 80° 22' 32" E)

9. සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරණගම්පළ අංක 52 - C ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රංවල පුරාණ විහාර භූමියේ ඇති පැරණි පිළිමගෙය (උතුරු අක්ෂාංශ 7 15' 08" N හා නැගෙනහිර දේශාංශ 80° 19' 24" E)

10. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර කොටහේන අංක 42 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොටහේන ශ්‍රී පරමානන්ද පුරාණ මහා විහාර භූමියේ ඇති පැරණි ධර්මශාලාව, පුස්තකාල ගොඩනැගිල්ල, සන්ථාර කුළුණ, චෛත්‍ය, ප්‍රතිමාගෘහයේ මධ්‍ය කොටස සහ එම එක් එක් ගොඩනැගිලි වටා අඩි 10 කින් යුතු භූමි පරිශ්‍ර (උතුරු අක්ෂාංශ 6° 95' 2" N හා නැගෙනහිර දේශාංශ 79° 86' 6" E)

11. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1042 දඹදෙණිය දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් ගලබොඩ ග්‍රාමයේ මාදන්ගහමුලවත්ත නැමැති ඉඩමේ පහත සඳහන් භූගෝලීය දත්ත ක්‍රමාංක මගින් වෙන්කර දක්වා ඇති භූමිය සහිත දඹදෙණි රාජධානියේ පැරණි පිට පවුර

| උතුරු අක්ෂාංශ | නැගෙනහිර දේශාංශ |
|---|---|
| 7˚ 21' 36.60" N | 80˚ 9' 24.42" E |
| 7˚ 21' 35.90" N | 80˚ 9' 28.37" E |
| 7˚ 21' 37.26" N | 80˚ 9' 33.34" E |
| 7˚ 21' 37.01" N | 80˚ 9' 33.46" E |
| 7˚ 21' 35.59" N | 80˚ 9' 28.35" E |
| 7˚ 21' 36.12" N | 80˚ 9' 24.43" E |

EOG 03 - 0223

---

එල්. ඩී. බී. 277/40

## (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත

16 වන වගන්තිය යටතේ වන නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 16 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මම, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා "පැරණි ස්මාරක" වශයෙන් සලකනු ලැබිය යුතු බව ප්‍රකාශයට පත්කරමි.

**විදුර වික්‍රමනායක,**
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2024 මාර්තු මස 15 දින,
කොළඹ දී ය.

උපලේඛනය

**පැරණි ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ස්මාරක**

1. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්දුම්මුල්ල 157 ඒ, ග්‍රාම නිලධාරී වසමට අයත් හල්දුම්මුල්ල ග්‍රාමයේ කොටුගොඩැල්ල නමින් හඳුන්වන ස්ථානයේ ඇති පැරණි බලකොටුවේ පාදම සහ එහි සිට සිව්දිශාවට මීටර් 10 ක් බැගින් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 6°44'47.74" N හා නැගෙනහිර දේශාංශ 80°53'38.61"E)

2. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඌවතැන්න 158 සී, ග්‍රාම නිලධාරී වසමට අයත් ඌවතැන්න බලකොටුවේ නටබුන් හා එහි සිව් දිශාවෙන් මීටර් 10 ක් බැගින් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 6°44'53.92"N හා නැගෙනහිර දේශාංශ 80°50'40.58"E)

3. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලුත්වැව 381, ග්‍රාම නිලධාරී වසමට අයත් අලුත්වැව පොත්ගුල් විහාර භූමියේ ඇති ස්තූපය, ටැම්පිට ගොඩනැගිල්ල, ප්‍රාකාරබැමි ඇතුළු අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක සහ එම ස්මාරක පිහිටි භූමියේ සිට සිව් දිශාවට අඩි 30ක් වශයෙන් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°149395"N හා නැගෙනහිර දේශාංශ 80°444481"E)

4. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබැතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැබැතිගොල්ලෑව අංක 18 ග්‍රාම නිලධාරී වසමට අයත් කැබැතිගොල්ලෑව ශ්‍රී ධර්මවර්ධනාරාම විහාර භූමියේ ඇති පැරණි ස්තූප ගොඩැල්ල සහ ඒවටා මීටර් 05 ක භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°63816"N හා නැගෙනහිර දේශාංශ 80°66660"E)

5. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබැතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිත්තගෝනෑව අංක 33 ග්‍රාම නිලධාරී වසමට අයත් කැබැතිගොල්ලෑව ග්‍රාමයේ පිහිටි සුදර්ශනාරාම විහාර භූමියේ ඇති ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටබුන් ස්ථානය සහ එහි සිට උතුරු දිශාවෙන් මීටර් 02 ක් ද නැගෙනහිර දිශාවෙන් මීටර් 05 ක් ද දකුණු හා බටහිර දිශාවලින් මීටර් 10 ක් ද වශයෙන් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°69816"N හා නැගෙනහිර දේශාංශ 80°75151"E)

6. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම්පලාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශුද්ධනගරය 299 ග්‍රාම නිලධාරී වසමට අයත් කොහොඹගස් හන්දිය ග්‍රාමයේ පිහිටි පූර්වාරාම විහාර භූමියේ ඇති පැරණි තෙමහල් ගොඩනැගිල්ල සහ ඒවටා මීටර් 5 කින් යුතු භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°354413"N හා නැගෙනහිර දේශාංශ 80°40547"E)

7. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තම්මැන්නාගල ඇලවක අංක 63 ග්‍රාම නිලධාරී වසමට අයත් දිවුල්වැව ග්‍රාමයේ පිහිටි කිරළාගල පුරාණ විහාර භූමියේ ඇති ස්තූප ගොඩැල්ල සහ ඒ වටා මීටර් 10 ක භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°34892"N හා නැගෙනහිර දේශාංශ 80°41122"E)

8. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 46 මහකුඹුක්ගොල්ලෑව ග්‍රාම නිලධාරී වසමට අයත් මහකුඹුක්ගොල්ලෑව ශ්‍රී දළදා විහාර භූමියේ ඇති පධානඝරය සහ ඒ ආසන්නයේ ඇති ගල්කණු සහිත ගොඩැල්ල සහ එම නටබුන් ස්ථාන වටා උතුරු දිශාවෙන් මීටර් 10 ක් හා දකුණු නැගෙනහිර හා බටහිර දිශාවලින් මීටර් 20 ක් සහිත වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°63113"N හා නැගෙනහිර දේශාංශ 80°47937"E)

9. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 418 තඹුත්තේගම ග්‍රාම නිලධාරී වසමට අයත් පුරාණ ගම්මැද්ද ග්‍රාමයේ ඇති ටැම්පිට ගොඩනැගිල්ල සහ ඒ වටා මීටර් 05 ක භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°14401"N හා නැගෙනහිර දේශාංශ 80°287073"E)

10. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 324 බෝගහවැව ග්‍රාම නිලධාරී වසමට අයත් මරදෙනිගම ග්‍රාමයේ පිහිටි රංගිරි විවේක සේනාසන විහාර භූමියේ ඇති හිඳි බුද්ධ ප්‍රතිමා 03, පැරණි මුරගල් කොරවක්ගල් හා පියගැට පෙළ සහිත ප්‍රතිමා ගෘහය සහ ඒ වටා උතුරු, නැගෙනහිර හා දකුණු දිශාවලින් මීටර් 05 ක් ද බස්නාහිර දෙසින් මීටර් 02 ක් ද වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°33183"N හා නැගෙනහිර දේශාංශ 80°24940"E)

11. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 320 කුකුල්කටුව ග්‍රාම නිලධාරී වසමට අයත් රනෝරාව ග්‍රාමයේ පිහිටි ශ්‍රී රජමහා ගල්විහාර භූමියේ ඇති පැරණි ස්තූප ගොඩැල්ල, පර්වත ලිපිය හා අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක සහිත ගල් තලාව සහ ඒවටා මීටර් 5 ක භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°36283 N හා නැගෙනහිර දේශාංශ 80°16388"E)

12. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 329 කටුපත්වැව ග්‍රාම නිලධාරී වසමට අයත් පන්වැව ග්‍රාමයේ කැලෑ තම්මැන්නාව අසළ පිහිටා ඇති ස්තූප ගොඩැල්ල, පියගැටපෙළ සහ ගොඩනැගිලි සාධක සහිත ගල්වැටිය සහ එම ගල්වැටිය වටා මීටර් 10 ක් බැගින් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°26706 N හා නැගෙනහිර දේශාංශ 80°11124"E)

13. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 327 හුණුවිලගම ග්‍රාම නිලධාරී වසමට අයත් මුවවෙම්බුව ග්‍රාමයේ ඇති ස්තූප ගොඩැලි නටබුන්, ගල්බැම් සාධක සහ සඳකඩපහන ඇතුලු අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක පිහිටා ඇති ගල්වැටිය සහිත කිරලාගල නමින් හඳුන්වන පුරාවිද්‍යා භූමිය සහ ඒවටා මීටර් 10 ක් බැගින් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°314674 N හා නැගෙනහිර දේශාංශ 80°157157"E)

14. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැලවගම අංක 349 ග්‍රාම නිලධාරී වසමට අයත් නැලවගම කුඹුරු ඉඩමේ පිහිටා ඇති ගොඩනැගිලි නටඹුන් ස්ථානය සහ ඒවටා මීටර් 05 ක භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°209435' N හා නැගෙනහිර දේශාංශ 80°1824E)

15. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හුණුවිලගම 327 ග්‍රාම නිලධාරී වසමට අයත් හබවැව ග්‍රාමයේ පිහිටා ඇති ස්තූප ගොඩැල්ල, ටැම්පිට ගොඩනැගිල්ල සහ එම නටබුන් භූමියේ සිට සිව් දිශාවට මීටර් 5 බැගින් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8°302140' N හා නැගෙනහිර දේශාංශ 80°144219E)

16. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 577 මිහින්තලේ නගරය ග්‍රාම නිලධාරී වසමට අයත් මිහින්තලේ නගරයේ ඇති පතිරාජ තෙන්නකෝන් කනිෂ්ට විද්‍යාල භූමියේ ඇති වෙඩ්බෙහෙත් ගබඩා ගොඩනැගිල්ල සහ ඒ වටා මීටර් 10 ක භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 8.35816'' N හා නැගෙනහිර දේශාංශ 80.51331E)

17. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 259 -4 ඇළ ග්‍රාම නිලධාරී වසමට අයත් ශ්‍රාවස්තිපුර 4 ඇළ ග්‍රාමයේ ඇති ස්තූප ගොඩැල්ල සහ ගොඩනැගිලි නටබුන් සහිත දෙමටගල ගල්වැටිය. (උතුරු අක්ෂාංශ 8.295084 භ හා නැගෙනහිර දේශාංශ 80.380624 E)

18. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුගල්ල අංක 376, ග්‍රාම නිලධාරී වසමට අයත් කොතලකෙමියාව ග්‍රාමයේ පිහිටි කොලකෙමියාව පුරාණ ගිරිලෙන් විහාර භූමියේ ඇති පුවරු ලිපිය සහ පහත සඳහන් භූගෝලීය දත්ත ක්‍රමාංක මඟින් වෙන් කරනු ලබන භූමි පරිශ්‍රය.

| උතුරු අක්ෂාංශ | | නැගෙනහිර දේශාංශ |
|---|---|---|
| 7°43′0.95”N | - | 80°23′1.72” E |
| 7°43′0.86”N | - | 80°23′2.24” E |
| 7°43′0.10”N | - | 80°23′2.08” E |
| 7°43′0.20”N | - | 80°23′1.57” E |

19. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටුව උතුර 9326 ග්‍රාම නිලධාරී වසමට අයත් කොටුව වැතැම් වීදියේ පිහිටා ඇති ජනාධිපති මන්දිරය සහ එහි සිට සිව් දිශාවට මීටර් 15 බැගින් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 6°56′6.59”භ හා නැගෙනහිර දේශාංශ 79°50′19.79”E)

20. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටුව උතුර 9326 ග්‍රාම නිලධාරී වසමට අයත් ගාලුමෝදර පිහිටා ඇති ජනාධිපති ලේකම් කාර්යාලය සහ එහි සිට උතුරු දෙසින් මීටර් 10 ක් ද නැගෙනහිර දෙසින් මීටර් 8 ක් ද දකුණු හා බටහිර දිශාවලින් මීටර් 16 ක් ද වශයෙන් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 6° 92′ 8.65”N හා නැගෙනහිර දේශාංශ 79° 84′3.16”E)

21. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිල්වත්ගම ඊ 433 සී ග්‍රාම නිලධාරී වසමට අයත් පහළවැව ග්‍රාමයේ පිහිටි සිල්වත්ගම ගල්පාලම සහ ඒ වටා මාර්ග රක්ෂිතයට සීමාවන භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 7°79′ 47.18′′ N හා නැගෙනහිර දේශාංශ 80°60′16.55”E)

22. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුගන්නාව 204 ග්‍රාම නිලධාරී වසමට අයත් කඩුගන්නාව ග්‍රාමයේ, කොළඹ- මහනුවර ප්‍රධාන මාර්ගයේ පිහිටා ඇති, ස්වභාවික ගල් පර්වතය හාරා සකස් කරන ලද කඩුගන්නාව බිංගෙය. (උතුරු අක්ෂාංශ 7°15′ 0.76′′ N හා නැගෙනහිර දේශාංශ 80°30′32.5”E)

23. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදන්වල 493 ග්‍රාම නිලධාරී වසමට අයත් මාදන්වල ග්‍රාමයේ පිහිටි මාදන්වල අම්බලම සහ එහි සිට උතුරු සහ නැගෙනහිර දිශාවෙන් මීටර් 3 ක් ද දකුණු දිශාවෙන් මීටර් 05 ක් ද බස්නාහිර දිශාවෙන් මීටර් 4 ක් ද වශයෙන් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 7°0959′ N හා නැගෙනහිර දේශාංශ 80°4653E)

24. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නපුර ග්‍රාම නිලධාරී වසමට අයත් රත්නපුර නගරය (උතුර) ග්‍රාමයේ ඇති කාර්තිගේෂන් ස්මාරකය. (උතුරු අක්ෂාංශ 6°40′ 58′′ N හා නැගෙනහිර දේශාංශ 80°24′02”E)

25. සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මීපිටිය 51 ජී ග්‍රාම නිලධාරී වසමට අයත් නාගොල්ලවත්ත ග්‍රාමයේ පිහිටි මහාධිකරණ විනිසුරු නිල නිවස සහ එහි උතුරු, නැගෙනහිර හා බටහිර දිශා වලින් මීටර් 2 බැගින් ද දකුණු දිශාවෙන් මීටර් 10 ක් ද වශයෙන් වූ භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 7°15′ 420′′ N හා නැගෙනහිර දේශාංශ 80 21′ 3386′′E)

26. සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොලහැල 51 ඊ ග්‍රාම නිලධාරී වසමට අයත් කෑගල්ල නගරය ග්‍රාමයේ ඇති දිසාපති නිල නිවස හා ඒවටා මීටර් 04 ක භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 7°15′ 273′′ N හා නැගෙනහිර දේශාංශ 80° 21′ 205′′E)

27. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිච්මන්ඩ් කන්ද 96 E ග්‍රාම නිලධාරී වසමට අයත් රිච්මන්ඩ් කන්ද ග්‍රාමයේ පිහිටි රිච්මන්ඩ් විද්‍යාල භූමියේ ඇති විදුහල්පති බංගලාව හෙවත් මිෂන්හවුස් ගොඩනැගිල්ල, පැරණි ගුරුනිවාසය, සික්රූම් නමින් හඳුන්වන ගොඩනැගිල්ල, ඩැරල් පුස්තකාලය, ස්මෝල් විද්‍යාගාර ගොඩනැගිල්ල, එල් ආකෘතික ගොඩනැගිල්ල සහ ප්‍රධාන ශාලාව.

28. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇතුඇළ ග්‍රාම නිලධාරී වසමට අයත් ඇතුඇළ ග්‍රාමයේ ඇති අතුඇළ පාලම. (උතුරු අක්ෂාංශ 6°14′ 38.7′′ N හා නැගෙනහිර දේශාංශ 80°28′46.4”E).

29. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 416 - සී මාතර කොටුව ග්‍රාම නිලධාරී වසමට අයත් මාතර කොටුව ග්‍රාමයේ පිහිටි යුධහමුදා කඳවුරු භූමියේ ඇති මාතර ඕලන්ද දිසාවේ වරයාගේ නිල නිවස්නය. (උතුරු අක්ෂාංශ 5°98.952 N හා නැගෙනහිර දේශාංශ 80°33.725E).

30. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 416 - සී මාතර කොටුව ග්‍රාම නිලධාරී වසමට අයත් මාතර කොටුව විල්ෆ්‍රඩ් ගුණසේකර මාවතේ පිහිටි ජනාධිපති විද්‍යාල භූමියේ ඇති විජයශාලව නමින් හඳුන්වන පැරණි ගොඩනැගිල්ල (උතුරු අක්ෂාංශ 5°98.952 N හා නැගෙනහිර දේශාංශ 80°33.725E).

31. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මිගෙට්ටුවත්ත ග්‍රාම නිලධාරී වසමට අයත් මිගෙට්ටුවත්ත ග්‍රාමයේ පිහිටා ඇති ගරුමුණි වලව්ව සහ ඒ වටා මීටර් 02 න් යුතු භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ 6°16′ 13.1′′ N හා නැගෙනහිර දේශාංශ 80°02′ 20.5′′E)

EOG – 03 - 0224

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.